(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 93.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2016 අගෝස්තු මස 24 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

440/'16

1.

ගරු ඩී. වී. චානක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් 250,000/=ක වටිනාකමින් යුත් නිවාස වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබුවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඉඩම් පිහිටි ස්ථාන කවරේද;

(ii) එම ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව මඟින් අදාළ ඉඩම් කැබලි හඳුනාගැනීම සිදුකර තිබේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිලාභීන්ගේ නම්, ලිපිනයන් සහ තෝරාගත් ක්‍රමවේදය කවරේද;

(v) ප්‍රතිලාභීන් තෝරාගැනීමට සහභාගි වූ රාජ්‍ය නිලධාරීන්ගේ නම් කවරේද;

(vi) තෝරාගත් ප්‍රතිලාභීන් ඉඩම් හිමිකමක් ලැබීමට නියම සුදුස්සන් බවට සෑහීමට පත්විය හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

446/'16

2.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, නාවලපිටිය අඩවියේ, සමනලගම ප්‍රදේශයේ පයිනස් ගස් 7000ක් කපා ඉවත් කරමින් සිටින බවත්;

(ii) නාවලපිටිය, මාපාකන්ද අක්කර 200කට සහ දොලොස්බාගේ, මල්ගොල්ල අක්කර 50කට අයත් පයිනස් ගස් පුද්ගලික වෙළෙඳුන් මඟින් කපා ඉවත් කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති බවත්;

(iii) දොලොස්බාගේ, පරගල කොටසේ ගස් 2500ක් පමණක් ඉවත් කිරීමට අවසර ලබාගෙන ඇතත්, මේ වනවිට අනවසරයෙන් ගස් 12,000ක් පමණ කපා ඉවත් කොට ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සියළුම ගස් ඉවත් කිරීම සඳහා අවසර ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදයන් සහ ඒවාට සම්බන්ධ නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එමගින් රජයට අයවිය යුතු විශාල මුදලක් අහිමි වී ඇති බව පිළිගන්නේද;

(iii) එම වංචා සහගත ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

504/'16

3\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SEFR209/2007 යටතේ ගොනුකර ඇති පෙත්සමට අදාළව ලබාදී ඇති නඩු තීන්දුවෙන් මතුකරනු ලැබූ කරුණු ගැන විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝගකර තිබෙන බවත්;

(ii) එම විමර්ශන කටයුතු සිදුකර එහි උද්ධෘත නීති උපදෙස් සඳහා 2008.12.08 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතත්, මෙතෙක් ඊට අදාළ උපදෙස් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම උපදෙස් ලබාගැනීමට පියවර ගන්නේද;

(ii) එම තොරතුරු කවරේද යන්න මෙම සභාවට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

516/'16

4\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන් කොපමණ සිටීද යන්න පිළිබඳ සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත මගපෙන්වන්නන් ලියාපදිංචි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) මෙම මගපෙන්වන්නන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මැදිහත් වන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජය ලබා දෙන්නේද;

(v) වෙරළාශ්‍රිත සංචාරක මගපෙන්වන්නන්ගේ සුබසාධනය වෙනුවෙන් ගන්නා වෙනත් ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/'16

5\.

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වට්ටක්කච්චි ප්‍රදේශයේ රජයේ කෘෂිකාර්මික ගොවිපළක් සහ කෘෂිකාර්මික විද්‍යාලයක් පිහිටා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගොවිපළෙහි විශාලත්වය කොපමණද; ගොඩ ඉඩම් හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

(iii) මේ වනවිට එම ගොවිපළ පාලනය කරන්නේ කවුරුන් විසින්ද; එය පරිහරණය කරන්නේ කවුරුන්ද;

(iv) අදාළ දෙපාර්තමේන්තුව යටතට එම ගොවිපොළ පවරා දෙන්නේද;

(v) නැවතත් එහි කම්කරුවන්ට රැකියා අවස්ථා ලබාදී එය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වට්ටක්කච්චි කෘෂිකාර්මික ගොවිපොළ සමඟ ඇති කෘෂිකාර්මික විද්‍යාලය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) වවුනියාව සහ කුණ්ඩසාලේ ඇති කෘෂි විද්‍යාලවලට සමාන අයුරින් මෙය ක්‍රියාත්මක වූ බව එතුමා දන්නේද;

(iii) යළිත් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එය අදාළ දෙපාර්තමේන්තුවට පවරා දී ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

602/'16

6\.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීම සඳහා පාර්ලිමේන්තුව මඟින් පනතක් සම්මත කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් පනතට අනුව පෞද්ගලික වෛද්‍ය ආයතන, පෞද්ගලික රෝහල් ලියාපදිංචිය, ඖෂධ හා වෛද්‍ය රසායනාගාර නියාමනය සහ වෛද්‍යවරුන්ගේ සුදුසුකම් ප්‍රදර්ශනය කිරීම ආදී කටයුතු වර්තමානයේදී නිසි ලෙස සිදු නොවන බව පිළිගන්නේද;

(ii) එම පනතේ නියමයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

606/'16

7.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා,

(i) රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගී වී ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) අග්‍රාමාත්‍යවරයාද ඇතුළත්ව එම සංචාර සඳහා සහභාගී වී ඇති මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් කවුරුන්ද;

(iii) සංචාරය කරන ලද රටවල් කවරේද;

(iv) එම විදේශ සංචාරවලින් රාජකාරි හා පෞද්ගලික සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අ (i) හි සඳහන් සංචාරයන් සඳහා රජයේ නිලධාරින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත කාලසීමාව තුළ රජයේ මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් සහභාගී වී ඇති විදේශ සංචාරවලට වැය වී ඇති මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

617/'16

8.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි තිරුක්කේදීස්වර කෝවිල හින්දු ජනතාවගේ ශ්‍රද්ධ වූ පූජනීය ස්ථානයක් බවත්;

(ii) තිරුක්කේදීස්වර කෝවිලට ඉතා ආසන්නව පිහිටි කනපතිපිල්ලෙ විජයකුමාර් මහතාට අයත් ඉඩමෙහි නීතිවිරෝධී ලෙස බෞද්ධ විහාරයක් ඉදිකරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නීතිවිරෝධීව ඉදිකරන මෙම විහාරයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

647/'16

9.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යොවුන් පුරය 2016 උත්සවය පැවැත්වීමේ අරමුණු කවරේද;

(ii) එහි ප්‍රචාරණ කටයුතු සඳහා දරන ලද වියදම් කොපමණද;

(iii) එක් එක් ප්‍රචාරණ ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) යොවුන් පුරය 2016 සඳහා වියදම් කළ මුළු මුදල එක් එක් ශීර්ෂය යටතේ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මෙම උත්සවය පැවැත්වීමෙන් රජය අපේක්ෂා කළ අරමුණු ඉටු වී යැයි සෑහීමකට පත්වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

669/'16

10.

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල වරාය ආශ්‍රිතව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ විශේෂ ඉන්දීය ආර්ථික හෝ කර්මාන්ත කලාපයක් සඳහා රජය අවසර දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන් කැබිනට් පත්‍රිකාව හෝ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iii) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය පිහිටුවීමේ මූලික කොන්දේසි හා කළමනාකරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම විශේෂ ඉන්දීය ආර්ථික කලාපය සඳහා හඳුනාගෙන ඇති භූමියේ සිතියමක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

717/'16

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව නගර සභා බලප්‍රදේශයේ, පිළියන්දල දම්පෙ ගමෙහි අක්කර 79, රූඩ් 03, පර්චස් 21.74ක විශාලත්වයෙන් යුත් 'දම්පෙ වත්ත' නමැති පොල් ඉඩම කැබලි කිරීම සඳහා තේ, රබර් හා පොල් වතු පාලනය කිරීමේ හා කැබලි කිරීමේ පාලන මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්;

(ii) එකී ඉඩම් කැබලි කරන්නේ නම්, පොල් වගාවට මහත් හානියක් සිදුවන බවත්, රටේ පොල් පලදාවට බලපෑමක් සිදුවන බවත්, එබැවින් අදාළ ඉඩම කැබලි කිරීමට නිර්දේශ නොකරන බව සඳහන් කොට ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය, කළුතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය වෙත දන්වා ඇති බවත්;

(iii) ආර්ථිකයට හා පරිසරයට සිදුවන හානිය පිළිබඳව අවධානය යොමු කර ඉඩම කැබලි කිරීමට එරෙහිව මහජන විරෝධතාවක්ද ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තා නොසලකා, ඉඩම කැබලි කිරීම නිර්දේශ කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

520/’16

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ලිංගික පරිවර්තනයන් සිදු කර ගැනීමේ ප්‍රවණතාවයක් තිබේද;

(ii) එමඟින් ගැටලුකාරී තත්ත්වයන් මතු වන්නේද;

(iii) මේ සම්බන්ධයෙන් රජය ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර පහ ඇතුළත ලිංගික පරිවර්තනයන් සිදු කර ගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ රෝහල් තුළ මෙම ක්‍රියාවලියට අදාළ සැත්කම් සිදු කරන්නේද;

(iii) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජයේ රෝහල් තුළ සිදු වූ ලිංගික පරිවර්තනයන්ට අදාළ සැත්කම් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා රජය දරා ඇති වියදම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලිංගික පරිවර්තනයක් සිදු කර ගත් පුද්ගලයන්ගේ අනන්‍යතාවයට අදාළ ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය වෙනස් කිරීම් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාවලිය සිදු කරන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ලිංගික පරිවර්තනයක් සිදු කර ගත් පුද්ගලයන් අතර HIV ආසාදිතයන් වාර්තා වී තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) HIV ඇතුළු සමාජ රෝගයන් මෙම පිරිස් අතර ව්‍යාප්ත වීම පාලනයට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

604/’16

13.

ගරු ලකී ජයවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1980 අංක 27 දරන විලවුන්, උපකරණ හා ඖෂධ පනත යටතේ ශ්‍රී ලංකාවට විලවුන් ආනයනය කිරීමේදී ඒ සඳහා විලවුන්, උපකරණ හා ඖෂධ නියාමන අධිකාරියේ අනුමතිය ලබා ගත යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නමුත්, 2015 දී ස්ථාපිත කරන ලද ඖෂධ නියාමන අධිකාරි පනතින් විලවුන් විෂයය ඉවත් කිරීම මඟින් ශරීරයට අහිතකර විලවුන් වර්ග ආනයනය කිරීමට අවස්ථාව හිමි වී ඇති බවත්;

(ii) ශරීරයට අහිතකර එම විලවුන් භාවිතා කරන්නන් විවිධ ආසාත්මිකතාවයන්ට ලක්වී මරණයට සහ රෝගී තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙවැනි සිදුවීම් අවම කිරීම සඳහා, විලවුන් ආනයනය කිරීම නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

670/'16

14\.

ගරු බිමල් රත්නායක මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා කවර හෝ ගිවිසුමක්, එකඟතා ලියවිල්ලක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ලියවිල්ල සභාගත කරන්නේද;

(iii) ඒ සඳහා ලබා දුන් කැබිනට් අනුමතිය හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහිත ලියවිලි ඉදිරිපත් කරන්නේද;

(iv) සාම්පූර් බලාගාරය නඩත්තුව සඳහා ඉන්දු - ලංකා ඒකාබද්ධ සමාගමක් ස්ථාපිත කර තිබේද;

(v) එසේ නම්, එම සමාගමේ වත්කම් හා කළමනාකාරීත්වයට අදාළ එකඟතා හා කොන්දේසි කවරේද;

(vi) සාම්පූර් බලාගාරය සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(vii) එම ඉඩමේ සිතියමක් (Plan) සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

706/'16

15\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනවාරි 08 වැනි දින සිට මේ දක්වා අධිකරණ අමාත්‍යවරයා සහ බුද්ධශාසන අමාත්‍යවරයා වශයෙන් සිදුකළ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් සංචාරය,

(i) සිදුකළ කාලවකවානුව;

(ii) අරමුණු;

(iii) වියදම් කළ මුදල;

(iv) රටට ලැබුණු ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම**

1.

මුදල් අමාත්‍යතුමා,— වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු (සංශෝධන),— 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 20 දිනැති අංක 1950/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 28 දිනැති අංක 1951/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 පෙබරවාරි 29 දිනැති අංක 1956/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මාර්තු 08 දිනැති අංක 1957/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අප්‍රේල් 01 දිනැති අංක 1960/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 12 දිනැති අංක 1966/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 මැයි 20 දිනැති අංක 1967/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජූනි 16 දිනැති අංක 1971/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ තීරු ගාස්තු සම්බන්ධයෙන් 2016 ජූනි 16 දිනැති අංක 1971/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 අප්‍රේල් 29 දිනැති අංක 1964/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 2 දිනැති අංක 1965/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 16 දිනැති අංක 1967/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 4),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 මැයි 19 දිනැති අංක 1967/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.08.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

නීති කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 147 — වැඩසටහන 1,— † 2016 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භ වන හා 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් දැනටමත් අනුමත කර ඇති වියදම් සීමා නොඉක්මවන පරිදි එහි විවිධ වැය ශීර්ෂ යටතේ අපේක්ෂිත ඉතිරිවීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂයේ ''අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතියට'' මාරුකර ගැනීමටත් 2015 අංක 16 දරන විසර්ජන පනතේ 6.1 හා 6.2 වගන්ති මඟින් සලසා ඇති විධිවිධානවලට යටත්ව හඳුනාගත් විදේශ මූල්‍යකරණ සහිතව ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් පරිපූරක ප්‍රතිපාදන ලෙස අදාළ අමාත්‍යාංශවලට මාරු කිරීමට හැකිවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයට අයත් අනෙකුත් ඕනෑම අරමුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව විසින් මූල්‍යකරණය කරන ලද රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් (රු.592,925,000) නොඉක්මවන මුදලක් උපලේඛනයේ දක්වා ඇති ආකාරයට සලසා ගත යුතු ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 147 | - ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 1 | - මෙහෙයුම් වැඩසටහන | |
| පුනරාවර්තන වියදම් | | - | රු. 469,425,000 |
| මූලධන වියදම් | | - | <u>රු. 123,500,000</u> |
| | | මුළු වියදම = | **<u>රු. 592,925,000</u>** |

(රුපියල් පනස්නව කෝටි විසිනව ලක්ෂ විසිපන්දහසක් පමණි.)

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ''බී'' ගිණුම**

| | |
|---|---|
| උපරිම වියදම් සීමාව | - රු. 2,000,000 |
| අවම ලැබීම් සීමාව | - රු. 150,000 |

උපරිම හර ශේෂ සීමාව - රු. 3,500,000

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2016 අගෝස්තු මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2016 අංක 2 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 එකතුව රුපියල් 55,000,000.

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරියගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය අනුව කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටුකරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත්කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින්ද;

අවදානමක් දැරිය යුතු තනතුරක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට 2015.02.12 දින රජයේ අවශ්‍යතාවය මත නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල් ධූරයේ රාජකාරි කළ ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය පත්කිරීම මත, ඇයට පෞද්ගලික වන සේ පහත සඳහන් වැටුප් හා දීමනා 2015.02.12 දින සිට ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) අතිරේක සොලිසිටර් ජනරාල් තනතුරට හිමි මාසික වැටුප සහ සියලු දීමනා (දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව සහ නිවාස කුලී දීමනාව හැර);

සහ

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයට හිමි අමාත්‍යාංශ ලේකම් දීමනාව, දුරකථන දීමනාව, ඉන්ධන දීමනාව හා රජයේ නිල නිවාසයක් ලබාදී නොමැති නම් නිවාස කුලී දීමනාව.

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජනාධිපති නීතිඥ ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— 2016 ජූනි 22 දිනැති අංක 1972/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින්, සිංහල හා දෙමළ භාෂා පිටපත්වල මුද්‍රණ දෝෂ නිවැරදි කරනු ලැබූ, මෝටර් වාහන පනතේ (203 වැනි අධිකාරය වූ) 122 වගන්තිය සහ VII අ කොටස සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 02 දිනැති අංක 1939/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.07.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත ගෙවනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන් හා සාමාජිකයින් වෙත පහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා, අදාළ කොමිෂන් සභා සත්‍ය වශයෙන්ම රාජකාරි ආරම්භ කරන ලද දිනය, අදාළ ගෙවීම් බලාත්මක වන දිනය ලෙස සලකමින් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) නිල බලයෙන් පත්වන සභාපතිවරයන් හැර අනෙකුත් සභාපතිවරයන් සඳහා රු. 100,000/-ක මාසික දීමනාවක් ද, රු. 10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්ද;

(ආ) නිල බලයෙන් පත්වන ස්වාධීන කොමිෂන් සභා සභාපතිවරයන් සඳහා තම නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනාවලට අතිරේකව, ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරයෙකුගේ මාසික දීමනාවෙන් 50%ක මාසික දීමනාවක්ද;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හැර අනෙකුත් ස්වාධීන කොමිෂන් සභාවල නිල බලයෙන් පත් නොවන සාමාජිකයින් සඳහා රු. 75,000/-ක මාසික දීමනාවක්ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණය අනුව කිලෝ මීටර් 350 දක්වා රු. 25,000/-ක ප්‍රවාහන දීමනාවක් හෝ කිලෝ මීටර් 350ට වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු. 50,000/-ක ප්‍රවාහන දීමනාවක්ද;

(ඈ) 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 3/2015 විධිවිධාන පරිදි නිල බලයෙන් පත්වන සාමාජිකයින් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 10,000/-ක දීමනාවක්ද;

(ඉ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ (8) වැනි වගන්තියට අනුව එම කොමිෂන් සභාවේ සභාපතිට හා සමානව සාමාජිකයින්ට ද බලතල පැවරී ඇති බැවින්, එම කොමිෂන් සභාවේ සාමාජිකයින්ට රු. 95,000/-ක මාසික දීමනාවක් ද, රු. 8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් හා එම වාහනය සඳහා ඉන්ධන ලීටර් 170ක් හෝ වෙළඳපොළේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක්;

සහ

(ඊ) මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයින් වෙත, මැතිවරණයක් ප්‍රකාශයට පත් කළ දින සිට ප්‍රතිඵල නිකුත් කරන දින දක්වා වූ කාලසීමාව සඳහා ඔවුන්ගේ මාසික දීමනාවෙන් ¾ක විශේෂ දීමනාවක් ද.

ඊට අනුකූලව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභා නවයෙහි සභාපතිවරයන්ට හා සාමාජිකයින්ට ඉහත සඳහන් පාරිශ්‍රමිකයන් හා වෙනත් දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— කාර්මික ආරවුල් පනත යටතේ නියෝග,— කලින් කලට සංශෝධනය කරන ලද, 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (131 වැනි අධිකාරය වූ) 39 වැනි වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.07.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*25.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ඇ වගන්තිය සමඟ කියවියයුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*27.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*28.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**